**www.wsws.org**

**ලෝක සමාජවාදී වෙබ් අඩවිය**

**හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය**

ලෝක සමාජවාදී වෙබ් අඩවියේ වාර්තාකරු සමග සම්මුඛ සාකච්ඡාවක්

# විසි එක් වන සියවසේ චීනය තුල ධනවතුන් හා දුගීන්

***Interview with WSWS correspondent***

**Rich and poor in twenty-first century China**

**පලමු කොටස**

Part One

**2004 දෙසැම්බර් 7**

*පහත පලවන්නේ වසර ගනනාවකට පසුව ප්‍රථම වතාවට මෑතක දී චීනයේ සංචාරයක යෙදුනු ලෝක සමාජවාදී වෙබ් අඩවියේ වාර්තාකරුවකු වන ජෝන් චෑන් සමග පැවති කොටස් දෙකකින් යුත් සම්මුඛ සාකච්ඡාවක ප්‍රථම කොටස යි. චෑන් උපත ලැබුවේ හා හැදී වැඩුනේ එහි දකුනු දිග ගුවාන්ඩොං පලාතේ ය. සිය මෑත ගමනේ දී ඔහු පලාත් අගනුවර වන ගුවාංෂො මෙන් ම තවත් නගර හා ගම්මාන ගනනාවක ම සංචාරය කලේ ය.*

**ලෝසවෙඅ:** එහි ලගාවීමෙන් පසුව ඔබට මුලින් ම ඇති වූ හැඟීම් මොනවාද?

**ජෝන් චෑන්:** මට ඇති වූ මුල්ම හැඟීම නම් ආර්ථික සෞභාග්‍යය පිලිබඳ තරමක සාවද්‍ය ප්‍රතිරූපයකි. මෙය වනාහි බොහෝ සංචාරකයන් ද ප්‍රථම වතාවට පෙරලා තම රටට පැමිනෙන එතෙර වෙසෙන චීන ජාතිකයන් ද අසුවන උගුලකි. දැවැන්ත වෙනස්කම් සිදුව ඇති බව ද තමන්ට හුරු පුරුදු ස්ථාන බොහොමයක් තව දුරටත් හඳුනාගත නොහැකි බව ද ඔවුහු දකිති. නාගරික භූදර්ශනය නිරන්තර වෙනස්වීමකට භාජනය වෙමින් පවතී. කලින් වෙනම ප්‍රාදේශීය පාලනයන් තිබූ ගුවාංෂො නගරයට යාබදව පිහිටි පත්තු බොහොමයක් දැන් අගනුවරට අයත් කොටස් ලෙස ඇතුලත් කර ගෙන තිබේ.

අන්තර් ජාලය, ජංගම දුරකතන සහ වෙනත් නවීන පනිවිඩ හුවමාරු ක්‍රම පුලුල්ව පාවිච්චි කිරිම හේතු කොට ගෙන මිනිස්සු අද බෙහෙවින් දැනුවත්ව සිටිති. ගුවාන්ඩොං වැනි වෙරල බඩ ප්‍රදේශවල තරුන හා මැදි වියේ පුද්ගලයන් සෑම කෙනෙක් ම පාහේ ජංගම දුරකතනයක හිමිකරුවෙකි.

1990 ගනන්වලට වඩා බෙහෙවින් මෝටර් රථ දක්නට ලැබේ. අන්තර් ජාතික මොටර් රථ සමාගම් නැග එන මධ්‍යම පන්තිය වෙනුවෙන් සාපේක්ෂව ලාභ එහෙත් තරමක් ගුනාත්මක භාවයෙන් අඩු මාදිලියේ මෝටර් රථ දශ ලක්ෂ ගනනින් නිෂ්පාදනය කරමින්, සමස්ත කර්මාන්තය ම පාහේ සිය ඒකාධිකාරයට නතු කර ගෙන සිටී. ගුවාංෂො වැනි නගරවල ගමනාගමනය අවුල් සහගත ය. ඒ මක් නිසා ද කිය තොත් මෝටර් රථ පාවිච්චි කරන්නන්ගේ උමතු වර්ධනය සමග පැහීමට පොදු කාර්ය ව්‍යුහය කිසිසේත් ම සමත් නොවීම හේතු කොට ගෙන ය. සෑම වසරක ම චීනයේ මාර්ග අනතුරුවලින් පුද්ගලයන් දස දහස් ගනනින් මිය යාම පුදුමයට කාරනාවක් නොවේ.

නව මාවත්, මහා මාර්ග සහ විදුලි පනිවුඩ ජාල විශාල වසයෙන් වර්ධනය වී තිබේ. විදේශ ආයෝජන චීනයට ගලා එන්නේ හුදෙක් ලාභ ශ්‍රමය නිසා පමනක් නොව වැඩි දියුනු පොදු කාර්ය ව්‍යුහය ද හේතු කොට ගෙන ය. පොදු කාර්ය ව්‍යුහය ප්‍රමානවත් නොවීම හේතු කොට ගෙන බොහෝ තුන් වන ලෝකයේ රටවලට චීනය සමග තරග කල නොහැකි වී තිබේ. එම තතු එවන් රටවල නිෂ්පාදන වියදම් විශාල ලෙස ඉහල දමන අතර ඒවායේ පවත්නා ලාභ ශ්‍රමයෙන් ගත හැකි වාසියට ද වල කපයි. එහෙත් චීනයේ මෙම වර්ධනයන් වෙරල බඩ ප්‍රදේශවලට පමනක් සීමා වන අතර අභ්‍යන්තර පලාත් තව මත් පසුගාමිත්වයේ හා දරිද්‍රතාවයේ ගිලී පවතී.

“ප්‍රතිරූප ව්‍යාපෘති” ද බෙහෙවින් දක්නට ලැබේ. ප්‍රාදේශීය නිලධාරින් මහජනතාව වෙනුවෙන් කිසිවක් නො කරන අතර එහෙත් තම නගර පිලිබඳව සාවද්‍ය ප්‍රතිරූප නිර්මානය කිරීමට නම් ඔවුහු බෙහෙවින් දක්ෂ ය. මම ගුවාන්ඩොං පලාතේ නගර ගනනාවකට ම ගියෙමි. ඇතුලත තොරතුරු දන්නා අය මා සමග පැවසුවේ අලංකාර නාගරික භූදර්ශනවලට ආර්ථිකයේ සැබෑ තත්වය සමග කිසිදු සම්බන්ධයක් නැති බව ය. “ප්‍රතිරූපයට” පිටුපසින් සාමාන්‍යයෙන් පවතින්නේ දැවැන්ත නය කන්දරාවකි, එමෙන් ම අරමුදල්වලින් විශාල පංගුවක් කාදමන නාස්තිය හා දූෂනය යි. ප්‍රධාන ගාමකය වන්නේ තම නගරයට සෞභාග්‍යය ගෙන ඒමෙන් තමන් හොඳ වැඩක් කර ඇතැයි තම ඉහල නිලධාරින්ට පෙන්වීම යි. දෙවන හේතුව විදේශිකයන්ගේ සිත් ඇද ගැනීම යි.

ප්‍රථමයෙන් ම ඇති වන මෙම හැඟීම්, කෙසේ වෙතත්, දෘශ්‍යමානය පමනි. මිලියන 12 සිට 14 දක්වා වූ ජන සංඛ්‍යාවක් වෙසෙන ගුවාංෂො වැනි නගරයක සිටින විට ඔබට ඉක්මනින් ම වැටහෙනු ඇත්තේ මෙම දෘශ්‍යමාන සෞභාග්‍යයට පිටුපසින් ධනවතුන් හා දුගීන් අතර දැවැන්ත බෙදීමක් පවත්නා බව යි. දරිද්‍රතාව, විරැකියාව සහ සමාජ ගැටලු සෑම තැනක ම පැතිර පවතී.

මතුපිට දෘශ්‍යමානය පවා රැවටිල්ලකි. බොහෝ දෙනා, විශේෂයෙන් ම තරුනයෝ, ජේත්තුවට ඇද පලඳින අතර ජංගම දුරකතන හෝ ඩිජිටල් කැමරා ඔවුන් අත ඇත. මේවාට සෑහෙන මුදලක් වැය වන නමුදු ඒවා මිලට ගන්නේ ඒවායේ හිමිකරුවන් තමන් හැල්ලුවට ලක් වනු දැකීමට අකමැති බැවිනි. මුදලින් සමාජ තත්වය මනින අතිශයින් අසමානතාව රජයන සමාජයක, දුගීහු වෙනස්කම්වලට හා නින්දාවන්ට භාජනය වෙති. එම තතු මග හැරීම සෑම අයෙකුගේ ම අවශ්‍යතාව ය. ඒ සමග බැඳුනු “පාරිභෝගිකවාදය” පෙර නොවූ විරූ මට්ටමක පුද්ගලික නය කන්දරාවක් නිර්මානය කර තිබේ.

**ලෝසවෙඅ:** සමාජ භේදයේ දර්ශකයන් මොනවාද?

**ජෝ.චැ.:** ගුවාන්ෂො පිලිබඳ සිත් කාවදින කාරනාව නම් එය තව දුරටත් කැන්ටන්වරුන්ගේ නිජබිම නොවීම යි. එහි ජනගහනයෙන් හරි අඩකට වඩා සමන්විත වන්නේ එක්කො සෙසු පලාත්වලින් නැත හොත් ගුවාන්ඩොං පලාතේ සෙසු ප්‍රදේශවලින් පැමිනි සංක්‍රමනික කම්කරුවන්ගෙනි. බොහෝ දෙනෙක් නිෂ්පාදන කර්මාන්තවල පමනක් නොව, කුලී රථ පැදවීම, ආපන ශාලා සේවය හෝ කොන්ඩා මෝස්තර දැමීම වැනි සේවාවල ද නිමග්න වේ. මෙම ජනවිකාශමය වෙනස්කම් හේතු කොට ගෙන, කැන්ටන් වෙනුවට මැන්ඩරීන් නිල මට්ටමේ හෝ පොදු ස්ථානවල කතා කෙරෙන ප්‍රධාන භාෂාව බවට පත්ව තිබේ.

සමාජ ගැටලුවලට, විශේෂයෙන් ම අපරාධ වැඩිවීමට, හේතුව ලෙස සාමාන්‍යයෙන් දෝෂාරෝපනයට ලක් වන්නේ සංක්‍රමනික කම්කරුවන් ය. සොරුන්ගෙන් හෝ යතුරු පැදිවලින් එන ප්‍රහාරකයන්ගෙන් ප්‍රවේශම් වන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටින අනතුරු ඇඟවීමේ සංඥා සෑම තැනක ම දක්නට ලැබේ. සෑම ජනේලක ම, සඳලු තලයක ම හෝ දොරක ම වානේ පොලු සවි කිරීම මූලික ආරක්ෂක විධිවිධානයක් බවට පත්ව තිබේ. සෑම ගොඩනැගිල්ලක් ම කුරුලු කූඩුවකට සමාන ය.

සමහර මිනිසුන් ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ අතර පවත්නා වෙනස විස්තර කරන්නේ එක ම ආන්ඩුවක් විසින් පාලනය කෙරෙන එකිනෙකට වෙනස් රටවල් දෙකක් හෝ ලෝක දෙකක් වසයෙනි. සෞභාග්‍යමත් වෙරල බඩ ප්‍රදේශවල එක ලෝකයක් පවතී. එහෙත් රට අභ්‍යන්තරයේ පවත්නා අනෙක් ලෝකය ඊට පිටුපසින් ගාටයි. මේ නිසයි ගම්බද දුගීන් නගරවලට ගලා විත් ලාභ ශ්‍රමිකයන් බවට පත් වන්නේ. නිදසුනක් ලෙස, ඔබ ආපන ශාලාවලට ගිය හොත් දක්නට ලැබෙන්නේ ප්‍රාදේශීය කම්කරුවන් ඒවායේ සේවය කරන්නේ ඉතා අඩුවෙන් බව යි. ඒ ලැබෙන වැටුප ඉතා පහල මට්ටමක පවත්නා බැවිනි. කම්කරුවන්ට උපයා ගත හැකි හොඳම වැටුප බොහෝ විට මසකට යුවාන් 600 (එ.ජ. ඩොලර් 72) කි. කම්හල් කම්කරුවකුට ද ලැබෙන්නේ ඊට සමාන මුදලකි. අඩු වැටුප් හේතු කොට ගෙන බොහෝ තරුනියෝ විවිධාකාර ගනිකා වෘත්තීන්ට ඇද වැටෙති.

මීට ප්‍රතිකූල ලෙස, කාර්යාල සේවකයෙක් බොහෝ විට මසකට යුවාන් 2000ක් හෝ 3000ක් (එ.ජ. ඩොලර් 240-360) දක්වා වූ ආදායමක් උපයයි. ගුරුවරයෙක් ද ඊට සමාන මුදලක් උපයයි. නීතිඥයන්ට හා ගනකාධිකාරිවරුන්ට යුවාන් 7000-8000 (එ.ජ. ඩොලර් 845-960) අතර ප්‍රමානයක් හෝ ඊටත් වැඩි මුදලක් ඉපැයිය හැකි ය. එහෙත් මෙම සංඛ්‍යා ගුවාංෂො සඳහා ය. ප්‍රධාන වෙරල බඩ නගරවලින් පිටත ප්‍රදේශවල ආදායම් ඊට වඩා පහල ය.

චීනයේ ධනවත් ම ස්ථරයන් සම්බන්ධයෙන් ගත් කල, ඔවුන්ගේ සඟවා ඇති ධනය පිලිබඳ නිවැරදි සංඛ්‍යා ලේඛන නොමැත. ධනවත් ම පුද්ගලයන් පිලිබඳ ඊනියා ලැයිස්තුවල ප්‍රකාශයට පත් කෙරී ඇති බොහෝ සංඛ්‍යා බෙහෙවින් සැක සහිත ය. සුපිරි ධනවත්තු නිසැකව ම කෝටිපතියෝ ය. එහෙත් ඔවුහු තමන්ගේ ධන සම්පත් පිලිබඳ තොරතුරු ප්‍රසිද්ධියට පත් නො කරති. ඔවුන්ගේ ධනය ප්‍රදර්ශනය වන්නේ ඔවුන්ට අයත් සුඛෝපභෝගී නිවාසවලිනි. මිල අධික මෝටර් රථ ඒවා අසල ඔබ මොබ යන අතර පුද්ගලික ආරක්ෂක භටයෝ එම නිවාස වටා රැකවල් ලා ගෙන සිටිති. බොහෝ ධනවත් ව්‍යාපාරිකයෝ සිය ධනය හා සමාජ තත්වය ප්‍රදර්ශනය කරනු පිනිස විවෘතව ම අමතර අවිවාහක භාර්යාවන් තබා ගනිති. එය වනාහි වැඩවසම් චාරිත්‍රයක් යලි කරලියට ගෙන ඒමකි.

**ලෝසවෙඅ:** රැකියා විරහිතයන් මුහුන දෙන සමාජ තත්වයන් මොනවා ද?

**ජෝ.චැ.:** ආධාර යදින හෝ ඉදිකිරීම්, නිවාස කඩා ඉවත් කිරීම වැනි ඕනෑම ආකාරයක වැඩක් — ඇත්තෙන් ම ඕනෑම දෙයක් — ඉල්ලා සිටින පුවරු ඔසවා ගෙන බලා සිටින රැකියා විරහිතයන් බොහෝ සංඛ්‍යාවක් වීදිවල දක්නට ලැබේ. ඔවුන්ගේ වැටුප සාකච්ඡා කොට තීර්නය කරනු ලැබේ. එහෙත් බොහෝ දෙනෙකුට තමන් කරන වැඩ සඳහා ගෙවීමක් නොලැබේ. කම්කරුවන්ට හිමිවිය යුතු නොගෙවූ වැටුප් ප්‍රමානය — විශේෂයෙන් ම ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සමාගම්වල — බිලියන ගනනක් යැයි යන්න නිල වසයෙන් පිලිගැනෙන කාරනාවකි. සමහරු තමන්ගේ ඉරනම පිලිබඳ අවධානය යොමු කරගනු වස් සිය දිවි හානි කර ගෙන තිබේ.

මා මුලින් ම ගමන් මලු විශාල ප්‍රමානයක් සහිතව එහි ලඟා වූ විට, ඒ සියල්ල උඩු මහල කරා ගෙන

යන්නේ කෙසේ ද යන්න පිලිබඳව උත්සුක වූයෙමි. එහෙත් මගේ ඥාතියකු මට පැවසුවේ ඒ ගැන කරදර නො වන ලෙස යි — යුවාන් 10ක් තරම් සුලු මුදලකට ඔබට වීදියෙන් මිනිසුන් දෙදෙනකු අඬ ගසා ගත හැකි බව යි, ඔවුන් ඒ සියල්ල ඔබ වෙනුවෙන් කරනු ඇති බව යි. මොන යම් ආකාරයක හෝ ආදායමක් කෙසේ හෝ සොයමින් සිටින රැකියා විරහිතයන් සෑම තැනක ම දක්නට ලැබේ.

රාජ්‍ය ව්‍යවසායන්ගෙන් කම්කරුවන් බොහොමයක් දොට්ට දමා ඇති අතර ඔවුන්ට ද රැකියා නැත. බොහෝ දෙනෙක් යතුරු පැදිකරුවන් බවට පත්ව ඇත. එය වනාහි එක්තරා ආකාරයක ලාභ කුලී රිය සේවාවකි. එහෙත් ආන්ඩුව එලෙස යතුරු පැදි භාවිතය තහනම් කර තිබේ. එබැවින් එම කුලී රථ සේවය පවත්වා ගෙන යන්නේ රහසිගත හා නීති විරෝධී ස්වරූපයෙනි. 2006 සිට ගුවාංෂො නගරය තුල යතුරු පැදි මුලුමනින් ම තහනම් කිරීමට යයි.

රැකියා විරහිත භාවයට මුහුන දෙන්නේ දොට්ට වැටුනු කම්හල් කම්කරුවන් පමනක් නො වේ. විශ්වවිද්‍යාල උපාධිධාරිහු ද එම තත්වයට මුහුන දෙති. අතීතයේ දී, විශ්වවිද්‍යාල සිය උපාධිධාරීන් පිලිබඳ වාර්තා මාස හයක කාලය ඉක්මවා පවත්වා ගෙන ගියේ නැත. බොහෝ උපාධිධාරීන්ට මාස හයක් තුල දී රැකියාවක් සොයා ගැනීමට නොහැකි බැවින් දැන් මෙම පිලිවෙත මුලුමනින් ම වෙනස් කර ඇත. විශ්වවිද්‍යාල සිසුන්ට යම් ජීවන මාර්ගයක් සැපයීමක් වසයෙන් ආන්ඩුව කර ඇත්තේ ඔවුන් ව්‍යාපාර ඇරඹීමට උනන්දු කරනු පිනිස ව්‍යාපෘතියක් දියත් කිරීම යි. ඇත්ත වසයෙන් ම, එම ව්‍යාපාරවලින් බොහොමයක කෙරෙන්නේ කරත්තයක හෝ වීදිය අයිනේ තට්ටුවක තබා ගෙන නූඩ්ල්ස් හෝ ඩම්පිං අලෙවි කිරීම යි. තත්වය මංමුලා සහගත ය.

රැකියා සඳහා පවත්නා තියුනු තරඟය පිලිබඳ එක් නිදසුනක් නම්, සංගත ප්‍රතිව්‍යුහකරනයට ලක් කෙරෙමින් පවතින රාජ්‍ය-සතු ආයතනයක් වන නගරයේ පලතුරු සමාගමක තත්වය යි. මාස කිහිපයකට ඉහත දී, සමාගම එක් ස්ථිර තනතුරක ඇබෑර්තුවක් වෙනුවෙන් දැන්වීමක් පල කල අතර අයදුම් පත් සමාගමේ ඊ-මේල් ලිපිනයට තව මත් දිනපතා ගලා එයි.

අනියම් කම්කරුවන් මුහුන දෙන තත්වය ඊටත් වඩා භයංකර ය. පලතුරු සමාගමේ එක් කම්කරුවකුට අනුව, යාබද ගම්මානයෙන් පැමිනි කාන්තාවන් දුසිම් ගනනාවක් එහි වැඩ කරන අතර ඔවුන්ට ලැබෙන්නේ මසකට යුවාන් 300ක් හෝ 400ක් පමනි. සමාගමේ අධ්‍යක්ෂවරයාගේ සටන් පාඨය මෙයයි: ඔබ මෙම වැටුප් භාර ගැනීමට අකමැති නම්, පිටව යනු. ඔබගේ තැන ගැනීමට බලා සිටින අය එලියේ බුරුතු පිටින් සිටී.

**ලෝසවෙඅ**: මසකට යුවාන් 300-400ක මුදලින් ජීවත් වන්නේ කෙසේ ද? එහි ජීවන වියදම පවතින්නේ කුමන මට්ටමක ද?

**ජෝ.චෑ.**: ගුවාංෂොහි ජීවන වියදම විශේෂයෙන් ම ඉහල ය. කාමර දෙකක නිවසක් කුලියට ගැනීමට බොහෝ විට මසකට යුවාන් 600 සිට 800 දක්වා මුදලක් වැය වේ. මිනිසුන් තදබදව වෙසෙන — විශේෂයෙන් ම සංක්‍රමනික කම්කරුවන් — නිවාස බොහොමයක් පවතී. ඔවුහු සාමාන්‍යයෙන් දුසිම් භාගයක හෝ දුසිමක පමන පිරිසක් එකට වාසය කරති. බොහෝ ව්‍යාපාරික ආයතන, විශේෂයෙන් ම කම්හල් හෝ ආපන ශාලා, සිය ග්‍රාමීය සංක්‍රමනික කම්කරුවන්ට නවාතැන් හා ආහාර සපයයි. එහි අරමුන වන්නේ වැටුප් පහල මට්ටමක තබා ගැනීම යි.

මා සමග කතා කල කුලී රියදුරන්ට අනුව, ජීවිකාව සොයා ගැනීම වඩ වඩාත් අමාරු වෙමින් පවතී. ඒ තරඟය තියුනු වීම හා තෙල් මිල ඉහල යාම හේතු කොට ගෙන ය. ඔවුහු ජීවන වියදම ඉහල යාම ගැන ඉරාකයට එරෙහි එක්සත් ජනපද යුද්ධයට දොස් පැවරූ අතර සතියකට දින 6ක් හෝ සමහර විට දින 7 ම පවා වැඩ කිරීමට තමන්ට සිදුව ඇතැයි ද පැමිනිලි කලහ.

නගර මධ්‍යස්ථානයෙන් පිටත නිවාස අහිමි ජනයා දක්නට ලැබේ. ගුවාංෂො නගර මධ්‍යයේ සාප්පු සහිත වීදිවල එලෙස නිවාස අහිමි ජනයා දක්නට නැත. ඊට හේතුව වන්නේ ඔවුන් නගරයේ "ප්‍රතිරූපයට" හානි කල හැකි බැවිනි. එහෙයින් ඔවුන් එම ප්‍රදේශවලින් පලවා හැරීමට ක්‍රියා කරන ආරක්ෂක භටයන් අනේක ප්‍රමානයක් සෑම තැනක ම දක්නට ලැබේ. ගුවාංෂොහි මුර සංචාරයන්ට සහාය පිනිස ආන්ඩුව මෙම භටයන් සේවයේ යොදවා තිබේ. ඔවුන් යොදා ගැනීම යම් ආකාරයකින් පොලිස් සේවය පුලුල් කිරීමකි. පවතින පොලීසිය මිලියන 12ක ජනයා වෙසෙන නගරයක් සඳහා ප්‍රමානවත් නොවේ.

හිඟන්නන් ද විශාල වසයෙන් දක්නට ලැබේ. ඔවුන්ගෙන් බොහොමයක් අත කුඩා දරුවන් ද සිටී. අනාථයන්, ගම්බද ප්‍රදේශවලින් පැමිනි මහලු කාන්තාවන් හෝ වෛද්‍ය ගැටලු හෝ මූල්‍ය දුෂ්කරතා සහිත නාගරික දුගීන් හිඟමන් යදින අයුරු ඔබට එහි දී දැකගත හැකි ය.

සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීම බොහෝ දෙනෙකුට ප්‍රධාන ප්‍රශ්නයකි. අද චීනයේ වෛද්‍ය ක්‍රමය කෙතරම් නම් මිල අධික ද කිය තොත්, බොහෝ පවුල්වලට ප්‍රධාන හෝ නිදන්ගත රෝගයක් වැලඳුන කල ප්‍රතිකාර සඳහා යන වියදම කිසිසේත් ම දැරිය නො හැකි ය. මා කියවූ නිල වාර්තාවක් පිලිගත් පරිදි, ගම්බද චීන ජනයාගෙන් හරි අඩකට සෞඛ්‍ය සේවාවන් අහිමි කෙරී ඇත. මෙය සිදු වූයේ 1990 ගනන්වල "වෙලඳ පොල ප්‍රතිසංස්කරන" වලට පසුව ය.

ගම්බද ප්‍රදේශ ද ඇතුලුව, රට පුරා බල පවත්වන ලාභ මහජන සෞඛ්‍ය සේවාව, 1949 විප්ලවයේ සමාජ ජයග්‍රහනවලින් එකක් විය. මෙය ඉදිරි පියවරක් ලෙස සැලකුනි. දැන් මධ්‍යම පන්තිකයන්ට පවා සිය වෛද්‍ය වියදම් දැරිය නො හැකි දෙයක් බවට පත්ව ඇත.

**ලෝසවෙඅ:** ඔබ ඔබගේ පැරනි පාසලට ගියා ද?

**ජෝ.වැ.:** ඔව්. මා ඉගෙන ගත් පාසලට ශිෂ්‍යත්ව දිනා ගැනීම සහ විශ්වවිද්‍යාල උපාධිධාරීන් බිහි කිරීම සම්බන්ධයෙන් දිගු කාලීන කීර්තියක් පවතී. දැන් අරමුදල් නොමැතිකම හේතු කොට ගෙන එය සැලකිය යුතු පරිහානියකට මුහුන දී ඇත. ප්‍රදේශයේ හොඳම ගුරුවරුන් ලෙස සැලකුනු එහි ගුරුවරුන්ගෙන් බොහොමයක් වැඩි වැටුපක් ගෙවන පුද්ගලික පාසල්වලට මාරු වී ඇත. සිය පැවැත්ම රැක ගනු වස් පාසල පන්ති ගනන දැවැන්ත ලෙස ඉහල දමා තිබේ. අප සිටි කාලයේ දී එක් එක් වසර මට්ටමේ පන්ති 5ක් හෝ 6ක් තිබූ අතර දැන් එය 20කි. බොහොමයක් දෙනා ධනවත් පවුල්වලින් පැමිනෙන ගාස්තු ගෙවන සිසුන් ය.

මා එහි සිටි කාලයේ දී, පාසලට එන තම ලමුන් වෙනුවෙන් ගාස්තු ගෙවූ නිලධරයන්ගේ හා ප්‍රාදේශීය ව්‍යාපාරිකයන්ගේ දරුවන් සිටියේ සුලු සංඛ්‍යාවකි. එහෙත් බොහෝ සිසුන් පාසලට තෝරා ගැනුනේ ඇතුලු වීමේ විභාගයකිනි. කම්කරු හා ගොවි පවුල්වල දරුවන් බොහෝ දෙනෙක් එහි සිටියේ ය. මෙම සංයුතිය දැන් වෙනස් වී ඇති බවක් පෙනී යයි. සමස්ත පාසලේ ම මට්ටම පහල වැටෙමින් පවතින අතර එය පැහැදිලිව ම තදබද ය.

**ලෝසවෙඅ:** පොදුවේ සැලකූ කල අධ්‍යාපනයේ තත්වය කෙබඳු ද?

**ජෝ.වැ.:** සාමාන්‍ය පවුල්වලට අධ්‍යාපනය සැලකිය යුතු බරක් බවට පත්ව ඇත. නිල වසයෙන් ගත් කල, චීන ආන්ඩුව තව මත් "නිදහස් අධ්‍යාපනය" සපයයි. ඒ වෙනුවෙන් දෙමව්පියන් ගෙවිය යුත්තේ වසරකට යුවාන් 3ක හෝ 4ක මුදලකි. එහෙත් ප්‍රායෝගිකව ගත් කල, එක් එක් පාසලට පරිපාලනමය ගාස්තු සහ වෙනත් අමතර ගාස්තු පවතී. එම තතු නිසා පවුල්වලට විශාල ධනයක් වැය කිරීමට සිදු වේ. පෙල පොත් අතිශයින් මිල අධික ය. පාසල් වඩ වඩා ව්‍යාපාර මට්ටමෙන් පවත්වා ගෙන යනු ලැබේ. බටහිර රටවලින් පැමිනි විදේශීය ගුරුවරුන් සහිත, ඉහල ධනවතුන් සඳහා වූ ඊනියා වංශාධිපති පාසල් ඇතුලු, පුද්ගලික පාසල් දැවැන්ත සංඛ්‍යාවක් වේගයෙන් බිහි වෙමින් පවතී. මෙම පාසල් විශේෂයෙන් ම වරප්‍රසාදිතයන්ට සීමා වන අතර අතිශයින් ම අධික ගාස්තු අය කරයි. එනම්, වසරකට ලක්ෂ ගනනක් වැය කිරීමට සිදු වේ.

**ලෝසවෙඅ:** මෙම සමාජ ගැටලුවලට හා ආතතීන්ට සාමාන්‍ය ජනයා දක්වන ආකල්පය කුමක් ද?

**ජෝ.වැ.:** විවිධ ස්ථරයන්ට විවිධ ආකල්ප පවතී. මගේ මිතුරන්ගෙන් සමහරෙක් මූල්‍යමයව හොඳ තත්වයක සිටී. එක් අයෙක් ඉංජිනේරු ආම්පන්න අපනයනය කරන විදේශීය වෙලඳ සමාගමක කලමනාකරුවෙකි. ආන්ඩුව තුල පවත්නා දූෂනය පිලිබඳ කතා බොහොමයක් ද බෙයිජිං පාලනය ඒවා සිදු වීමට ඉඩ දී ඇත්තේ මක් නිසා ද යන වග ද ඔහු මා සමග පැවසී ය. එහෙත් ඔහු ශුභවාදී විය: ගැටලු පවතින නමුත් චීනය අවසානයේ සෞභාග්‍යමත් සමාජයක් බවට පත් වනු ඇතැයි ඔහු කියයි.

තවත් අයෙක් විශාල තෙල් සමාගමක් සමග වැඩ කරන සැලකිය යුතු ව්‍යාපාරික අවශ්‍යතා සහිත ධනවත් කාන්තාවකි. හුදෙක් දේපොල පාලනය කරනවා පමනක් නොව ඒවායේ හිමිකරුවන් ද වන මෙම ස්ථරය අනාගතය සම්බන්ධයෙන් උත්සුකව සිටී. ඇය බටහිර රටක පුරවැසි භාවය ලබා ගැනීමේ මංමුලා සහගත උත්සාහයක යෙදී සිටී. ඒ ප්‍රථම කොට ම ඇයට ඇගේ ධනය එම රටට ගෙන යා හැකි බැවිනි. දෙවනුව, ඇයට විදේශීය ආයෝජකයකු ලෙස චීනයේ ආයෝජනය කල හැකි නිසා ය. විදේශ ආයෝජකයන්ට අමතර සහන ලැබේ.

**ලෝසවෙඅ:** එනම්, චීනයේ අනාගතයේ අස්ථාවරත්වය සම්බන්ධයෙන් එක්තරා නොසන්සුන් භාවයක් පවතින බව ද?

**ජෝ.වැ.:** ඔව්. අනාරක්ෂිත භාවය ධනවත් ප්‍රභූවේ හිසට ඉහලින් ලඹ දෙයි. මෙවන් කියමනක් පවතී: චීනය මුදල් ඉපැයීමට හොඳ තැනක් වන නමුත් එහෙත් ඒවා වින්දනය කිරීමට හොඳ තැනක් නො වේ. දැවැන්ත මුදලක් උපයන මිනිසුන් සිය නම් ප්‍රසිද්ධ වනු දැකීමට අකමැති වන්නේ එබැවිනි. නිදසුනක් ලෙස, මෑතක දී විශේෂයෙන් ම නිපදවන ලද සුඛෝපභෝගී යුරෝපීය මෝටර් රථ තුනක් චීනයේ දී අලෙවි කෙරුනි. එකදු ගැනුම්කරුවකුට වත් සිය ගනුදෙනුව ප්‍රසිද්ධියට පත් කිරීම අවශ්‍ය නොවූ නිසා මෙම මෝටර් රථ මිලදී ගත්තේ කවුරුන් ද යන වග කිසිවෙක් නොදනී.

දැවැන්ත මහජන විරුද්ධත්වයක් පවතින බව ධනවත්තු දනිති. මෑත වසරවල දී, චීනයේ ධනවත්ම පුද්ගලයන් කිහිප දෙනෙක් ඝාතනයට ලක්ව තිබේ. ඔවුන්ගේ මරනයන්ට මහජනතාව දැක්වූ ප්‍රතික්‍රියාව මෙම පොදු මනෝගතිය තුල පිලිඹිබු විය: ඔවුන් මරනයට පත් වූයේ ඔවුන්ගේ මුදල් අසාධාරනයෙන් ඉපැයූ දේවල් නිසා ය. කිසිවෙක් ඔවුන් සම්බන්ධයෙන් කිසිදු අනුකම්පාවක් ප්‍රකාශ කලේ නැත. "සමානතාවාදයට" එරෙහිව ප්‍රචාරක උද්ඝෝෂනයක් දියත් කිරීමේ අවශ්‍යතාව ආන්ඩුවට දැනී තිබේ.

**ලෝසවෙඅ:** ඔබ ගම්මාන ගනනාවක සංචාරය කලා. ඒවා කොයි වගේ ද?

**ජෝ.වැ.:** දැවැන්ත අභ්‍යන්තර පලාත්වල ගම්මාන සමග සැසඳූ කල ගුවාන්ඩොං පලාතේ ගම්මාන තරමක් හොඳ මට්ටමක පවතී. එබැවින් ඒවා ග්‍රාමීය චීනයේ ආදර්ශ ලෙස සැලකිය නො හැකි ය. එක ගමක පවුල් සියයක් පමන වාසය කරයි. ඔවුහු තව මත් වී ගොවිතැනෙහි හා සෙසු කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල යෙදෙති. එහෙත් ඔවුන්ගේ ආදායම බොහෝ සෙයින් රඳා පවත්නේ නගරවල රැකියාවක් සොයා ගත් සාමාජිකයන් මත ය. කිසිදු පවුලකට තමන් වවන දෙය මත කිසිසේත් ම රඳා පැවතිය නො හැක.

කෙසේ වෙතත්, වඩ වඩා ජනයා නගරයට යාමට මැලිකමක් දක්වයි. ඔවුන් මට පෙන්වා දුන්නේ නගරවල

ජීවිතය වඩා අසීරු බව යි. බොහෝ තරුනයෝ තව මත් සිය ගම්මාන හැර යති. ඒ ගොවිතැනින් තමන්ට අනාගතයක් ලැබෙන බවක් ඔවුන් නො දකින නිසා ය.

මෙම ප්‍රදේශවල පාසල්, ප්‍රවාහනය සහ සෙසු සේවාවන් පවතින්නේ සීමිතව ය. සමහර ගම්මානවල ඒවා කොහෙත්ම නැත. චීනයේ නිපදවන භාන්ඩ සාපේක්ෂව ලාභ බැවින් බොහෝ නිවාසවල විදුලි බලය සහ රූපවාහිනී යන්ත්‍ර, දුරකතන හා වීඩියෝ වාදන යන්ත්‍ර පවා ඇත. තත්වය පෙන්වන සලකුනු ලෙස එවන් භාන්ඩ තව දුරටත් නොසැලකේ. එහෙත් අයපහත් සනීපාරක්ෂක සහ නිවාස කොන්දේසි මෙන් ම අත්‍යවශ්‍ය සේවාවන් නැතිකම මෙම ගම් වැසියන් චීනයේ දෙවන පන්තියේ පුරවැසියන් බවට පත් කරයි.

ගම්බද ව්‍යාපාරික ස්ථරයන් මතු වීමත් සමග එක්තරා පන්ති භේදයක් පවතී. ඒ ඒ සුවිසල් මාලිගාව තම ප්‍රදේශයේ ධනවතුන්ගෙන් කාට කාට අයත් ද යන වග අප පිටත ඇවිදින කල, ප්‍රදේශයේ ගොවීහු මට පෙන්වා දුන්හ. සෑම ආකාරයක ම කුඩා නාගරික ව්‍යාපාර මතු වී තිබේ — කෘෂිකාර්මික ගොවිපලවල් පමනක් නොව කුඩා කාර්මික සමාගම් ද මේවාට ඇතුලත් ය.

මතු සම්බන්ධයි.

© www.wsws.org